මැනේජ්මන්ට් සර්විසස් රක්ෂණ (ප්‍රයිවට්) ලිමිටඩ් - 2019
--------------------------------------------------------------------

**1.1** මතය
------
මැනේජ්මන්ට් සර්විසස් රක්ෂණ ප්‍රයිවට් ලිමිටඩ් (“සමාගම“) හි 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය හා විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.
2019 දෙසැම්බර් 31 දිනට සමාගමේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2** මතය සඳහා පදනම
--------------------
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3** මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්
-----------------------------------------------------------------------------------------
මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම, අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීම ද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(i) වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

**1.4** මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම
-----------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බැවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැළසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම, වැරදි නියෝජනය හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැළසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, සමාගමේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත සමාගමේ අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථය ද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සමාගමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැළසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩල විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සමාගම ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව සමාගම කටයුතු කර ඇති බව,

- සමාගමේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| යම් විශේෂ ප්‍රමිතිය සමඟ අනුකූල නොවීම | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 1 (මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම) හි 27 ඡේදය අනුව "ආස්තිත්වයක් විසින් මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හැර එහි මූල්‍ය ප්‍රකාශන උපචිත පදනම් ගිණුම්කරණය මත පිළියෙල කළ යුතුය". කෙසේ නමුත්, 2018 ට අදාල වන්නාවූ සමහර ගණුදෙනු ලාභ අලාභ හා වෙනත් විස්තීරණ ආදායම් ප්‍රකාශනයේ ඇතුළත් කර තිබුණු බව සහ 2019 ට අදාල සමහර ගනුදෙනු 2019 ලෙජරයේ ඇතුළත් කර නොමැති බව නිරීක්ෂණය විය. | විගණකවරුන්ගේ අදහස සමඟ එකඟ වන අතර මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීමේ ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීමට අවශ්‍ය පියවර ගනු ඇත. | අනුකූල නොවීමේ ගැටලු වළක්වා ගැනීමට හා නිවැරදි අගයන් පෙන්වීමට මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරන අවස්ථාවේදී කළමනාකරණය ගිණුම්කරන ප්‍රමිති අනුගමනය කළ යුතුය. |

## 1.6 බදු රෙගුලාසි සමඟ අනුකූල නොවීම

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) සමාගම 2018 වර්ෂයට අදාල රු. 135,000 ක් වටිනා අයකරගත් යෙදවුම් බද්දක්, එකතු කළ අගය මත බදු ගෙවිය යුතු ගිණුමට මාරු කර නොතිබුණු අතර ලැබිය යුතු එකතු කළ අගය මත බදු ගිණුමේ වැරදි ලෙස ඉදිරියට ගෙන ගොස් තිබුණි. | විගණකවරුන්ගේ අදහස සමඟ එකඟ වන අතර මෙය 2020 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වලදී නිවැරදි කරනු ලැබේ. | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී මූල්‍ය ප්‍රකාශනවල මෙවැනි ආකාරයේ වැරදි වළක්වා ගැනීමට කළමනාකරණය උනන්දු විය යුතුය. |
| (ආ) රු.13,011,805 ක ගෙවිය යුතු එකතු කළ අගය මත බදු ශේෂය තුළ, 2018 වර්ෂයට පෙර සිට ගෙවිය යුතු ලෙස සඳහන් රු. 4,401,865 ක ශේෂයක් ඇතුළත් වූ අතර එය විගණන දිනය වන 2020 අගෝස්තු 14 වන විට පවා සසඳා නොතිබුණි. | මෙය සිදුවී ඇත්තේ සමාගමේ මෙහෙයුම්වල ස්වභාවය හේතුවෙනි. නමුත්, අපි අනාගතයේදී බලපෑම අවම කිරීමට අවශ්‍ය පියවර ගන්නෙමු. | මෙවැනි ආකාරයේ ගැටලු අනාගතයට යාම වළක්වා ගැනීමට කළමනාකරණය විසින් කාලීන පදනමකින් ගෙවිය යුතු ශේෂය සැසඳිය යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය ලාභයක් හෝ අලාභයක් වාර්තා කර නොතිබුණි. සමාගම එහි සියලු මෙහෙයුම් වියදම් එහි මව් සමාගමෙන් ප්‍රතිපූරණය කිරීම හේතුව වේ. එබැවින්, මූල්‍ය වර්ෂය අවසානයේදී ලාභයක් හෝ අලාභයක් දරා නොමැත.

### 2.2. ප්‍රවණතා විශ්ලේෂණය

| | 2019 | 2018 | 2017 | 2016 | 2015 |
|---|---|---|---|---|---|
| | Rs.000 | Rs.000 | Rs.000 | Rs.000 | Rs.000 |
| ආදායම | 583,542 | 491,113 | 428,684 | 345,013 | 323,109 |
| පරිපාලන වියදම් | 575,790 | 482,154 | 423,790 | 337,559 | 320,046 |
| වෙනත් වියදම් | 7,059 | 2,209 | 1,543 | 4,445 | 704 |
| පොදු කාර්ය සේවා | 274 | 4,680 | 2,389 | 1,882 | 290 |

### 2.3. අනුපාත විශ්ලේෂණය

| ගිණුම්කරණ අනුපාත | 2019 | 2018 |
|---|---|---|
| ජංගම අනුපාතය | 0.24 | 2.27 |
| ක්ෂණික වත්කම් අනුපාතය | 0.24 | 2.27 |
| තෝලන අනුපාතය | 186 | 145 |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1. අරමුදල් ඌණ උපයෝජනය

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2017 වර්ෂයේ අවසානයේ සිට 2019 වර්ෂයේ අවසානය දක්වා සමාගමට කිසිදු ප්‍රතිලාභයක් නොමැති රු.356,777 ක වටිනාකමක් ඇති ලංකා බැංකුවේ ක්‍රියාත්මක නොවන ජංගම ගිණුමක් සමාගම සතු විය. | සමාගමේ සියලු ගෙවීම් මව් සමාගම (ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපරේෂන් ලිමිටඩ් -SLIC) හරහා කරනු ලැබේ. ඒ අනුව, මෙම වටිනාකම SLIC බැංකු ගිණුම්වලට මාරු කිරීමට ක්‍රියාමාර්ග ගනු ලැබේ. | අරමුදල් අනිසි භාවිතය හෝ ඌණ භාවිතය වළක්වා ගැනීමට අනවශ්‍ය බැංකු ගිණුම් වසා දැමීමට පියවර ගත යුතුය. |

### 3.2 අවසර නොලත් ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රාජ්‍ය ව්‍යවසාය චක්‍රලේඛ අංක පීඊඩී 3/2015 හි 2.1 වගන්තියට අනුව, කළමනාකරණය වෙනත් විශේෂ ගෙවීම් සඳහා මුදල් අමාත්‍යාංශයෙන් අනුමැතිය ලබා ගත යුතු නමුත්, සමාගම 2018 වර්ෂය වෙනුවෙන් හිටපු සභාපතිවරයාට රු.777,828 ක ලාභ බෙදා ගැනීමේ ප්‍රසාද දීමනාවක් ගෙවා තිබුණි. මෙම මුදල අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පමණක් අනුමත කර තිබුණු අතර ගෙවීම නිදහස් කිරීමට පෙර මුදල් අමාත්‍යාංශයේ අනුමැතිය ලබා ගෙන නොතිබුණි. | හිටපු සභාපතිගේ වැටුප් ගෙවීම සඳහා මුදල් අමාත්‍යාංශයේ අනුමැතිය ලබා ගෙන තිබුණි. සමාගමේ ප්‍රතිපත්තිය අනුව සියලු කාර්ය මණ්ඩලයට ප්‍රසාද දීමනා ගෙවනු ලැබේ. හිටපු සභාපති විධායක සභාපතිවරයකු ලෙස පූර්ණකාලීනව සමාගමේ සේවය කර ඇති අතර සමාගමේ පරිචයට අනුව අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ඇතිව විධායක අධ්‍යක්ෂවරුන්ට / සභාපතිට ප්‍රසාද දීමනා ගෙවා ඇත. | සභාපතිවරයාට හෝ වෙනත් අධ්‍යක්ෂවරුන්ට ගෙවීම් කරන අවස්ථාවේදී කළමනාකරණය අමාත්‍යාංශ චක්‍රලේඛයට අනුකූල විය යුතු අතර අනවශ්‍ය ගෙවීම් වළක්වා ගත යුතුය. |